සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# භූගෝල විද්‍යාව - I

**13 ශ්‍රේණිය** | **කාලය පැය 02 යි.**

උපදෙස් :

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 02 කින් සමන්විත වේ.
- I කොටසට ඇතුළත් බහුවරණ ප්‍රශ්න 30 සඳහා මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.
- II කොටස හා I කොටස පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දෙන්න.

## I කොටස

(01) ''පරිසරය'' නමැති ශබ්ද කෝෂය නිර්මාණය කොට ඇත්තේ,

(1) මයිකල් ඇල්බි විසිනි. (2) රිචඩ් හාර්ට්ෂෝන් විසිනි.
(3) විලියම් ග්‍රෙගර් විසිනි. (4) ස්ටොඩාට් විසිනි.
(5) විතානගේ මහතා විසිනි. (......)

(02) ලොව වැඩිපුරම භාවිතා වන භාෂාව වන්නේ කුමක් ද?

(1) ඉංග්‍රීසි (2) හින්දි (3) චීන මැන්ඩරින් (4) ප්‍රංශ (5) සිංහල (......)

(03) ලොව වැඩිම සංඛ්‍යාවක් අදහන ආගම වන්නේ?

(1) ඉස්ලාම් (2) බුද්ධාගම (3) ක්‍රිස්තියානි
(4) හින්දු (5) චීන ජන ආගම් (......)

(04) ලොව ජනාවාස වල සංකේන්ද්‍රනයේ ඉහළම ප්‍රතිඵලය වන්නේ,

(1) ගම (2) නගරය (3) මහ නගරය (4) පුරවරය (5) නගරයාය (......)

(05) වර්තමානය වන විට ලොව වැඩිම ජන සංඛ්‍යාවක් පවතින රට,

(1) චීනය (2) ඉන්දියාව (3) නයිජීරියාව (4) ශ්‍රී ලංකාව (5) ඇමරිකාව (......)

(06) ලොව වැඩිම ජන සංඛ්‍යාවක් සිටින නගරය වන්නේ,

(1) මුම්බායි (2) ෂැංහයි (3) කොළඹ (4) ටෝකියෝ (5) චෙන්නායි (......)

(07) සාගර තරංග ආශ්‍රිත බලශක්ති බලාගාරයක් පවතින්නේ,

(1) ත්‍රිකුණාමලය (2) හම්බන්තොට (3) නුවරඑළිය (4) කල්පිටිය (5) ඔලුවිල් (......)

(08) කෘෂිකර්මාන්තයේ දියුණුව ගෙන ඒමට ඇති වූ විප්ලවය වන්නේ,

(1) කාර්මික විප්ලවය (2) හරිත විප්ලවය (3) හරිතාගාර විප්ලවය
(4) අරාබි විප්ලවය (5) ආහාර විප්ලවය (......)

(09) ලොව තිරිඟු නිෂ්පාදිත ප්‍රමාණයන් අනුව වැඩිම රට කුමක් ද?

(1) චීනය (2) ඉතියෝපියාව (3) ශ්‍රී ලංකාව
(4) ඇමරිකාව (5) බ්‍රසීලය (......)

(10) ශ්‍රී ලංකාවේ වැඩිම ජන ගනත්වයක් පවතින දිස්ත්‍රික්කය කුමක් ද?

(1) කොළඹ (2) ගම්පහ (3) කළුතර (4) ගාල්ල (5) මාතර (......)

(11) මේ අයුරින් නිර්මාණය වී ඇති නැමි හඳුන්වන්නේ,



(1) සමමිතික නැමි (2) අසමමිතික නැමි

(3) ඔත් නැමි (4) ඒකානති නැමි

(5) නැමි මණ්ඩල (......)

(12) සුවිභේද නිම්නයකට නිදසුනක් වන්නේ මින් කුමක් ද?

(1) රයින් නිම්න කලාපය (2) මරියානා ආගාධය (3) දූපත් චාප

(4) නයිල් නිම්න කලාපය (5) බර්මියුඩාව (......)

(13) මෙවැනි ලක්ෂණයක් පෙන්නුම් කරන ජලවහන රටාවක් හඳුන්වන්නේ,



(1) වලයාකාර (2) අරීය

(3) ශාඛීය (4) ජ්‍රේඛීය (5) ජාලාකාර (......)

(14) ගංගාවේ කිසියම් ස්ථානයක් පසුකර ගලා යන ජලයේ ප්‍රමාණය හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?

(1) ජල විසර්ජනය (2) අවසාදිත භාරය (3) ජල කඳ

(4) ද්‍රාවණය (5) ඉහත කිසිවක් නොවේ (......)

(15) මහද්වීප ප්ලවන කල්පිතය ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින් ද?

(1) ලෝතියන් ග්‍රීන් (2) ඇල්ෆ්‍රඩ් වෙග්නර් (3) ලිසික් හෝන්

(4) මෝර්ගන් (5) මෝල්තස් (......)

(16) තැටි එකිනෙකට මුහුණලා ගමන් කිරීම හඳුන්වන්නේ,

(1) අපසරණය වීම (2) අභිසරණය වීම (3) පරිවර්තනය වීම

(4) නිර්මාණ තැටි සීමා (5) අපසාරී බල සීමා (......)

(17) අක්‍රාන්ත යමහලක් නොවන්නේ මින් කුමක් ද?

(1) ඩෛක (2) සීල් (3) ආස්තර (4) බැතොලිත (5) යමහල් කේතු (......)

(18) වැල්ල දිගට පහළට ඇදෙන විට සාගර ජල කඳු හඳුන්වන්නේ,

(1) පිලි සෝදාව (2) පෙර පහර (3) ඉරුම් ප්‍රවාහ (4) රල බුන් (5) පැළ වෙරළ (......)

(19) තරංග නිධි සාධිත ලක්ෂණයක් නොවන්නේ කුමක් ද?

(1) කුණාටු වැල්ල (2) බොකුමුව පරය (3) මඩිහි වැල්ල

(4) වෙරලොබ පර (5) තුලු මුවක් (......)

(20) සොයිගම ලක්ෂණය හමුවන්නේ කුමන වර්ගයේ භූ රූප යටතේ ද?

(1) කාන්තාර භූ රූප (2) ග්ලැසියර් භූ රූප (3) ගංගා ආශ්‍රිත භූ රූප

(4) තරංග ආශ්‍රිත භූ රූප (5) හුණුගල් ආශ්‍රිත භූ රූප (......)

(21) මෙට්‍රික් සිතියමක භූමියේ 1km ක ප්‍රමාණයක් පෙන්වීමට භාවිතා කරන cm ගණන කීයද?

(1) 1cm (2) 0.5cm (3) 2cm (4) 1.5cm (5) 10cm (......)

(22) මෙට්‍රික් සිතියමක $16cm^2$ ක ප්‍රමාණයක් සැබෑ භූමියේ කොපමණ ප්‍රමාණයකින් දැක්විය හැකිද?

(1) 4km (2) 16km (3) 8km (4) 10km (5) 2km (......)

(23) පරිමාණය අනුපාතයක් ලෙස නිවැරදිව දක්වා ඇත්තේ,

(1) $\frac{1}{50\ 000}$ (2) 1 : 63360 (3) 1 : 63360 : 50000

(4) 1 : 2 : 3 (5) $\frac{1}{63\ 360}$ (......)

(24) සිතියම් වල භාවිතා වන භෞතික ලක්ෂණයක් නොවන්නේ,

(1) නිම්න (2) තෙරු (3) ඉදිකළ ප්‍රදේශය

(4) බෑවුම (5) රැලි බිම (......)

(25) මාතය, මධ්‍යස්ථය, මධ්‍යන්‍යය එකම අගයක් ගන්නා විට එම ව්‍යාප්තිය හඳුන්වන්නේ,

(1) ප්‍රථම ව්‍යාප්තිය (2) ධන කුටික ව්‍යාප්තිය (3) ඍණ කුටික ව්‍යාප්තිය

(4) අසමමිතික ව්‍යාප්තිය (5) ශූන්‍ය ව්‍යාප්තිය (......)

(26) 2, 10, 20, 24, 4, 6 මෙහි මධ්‍යන්‍යය වනුයේ,

(1) 22 (2) 8 (3) 11 (4) 20 (5) 24 (......)

(27) පහත අගයන්ගේ පරාසය නිවැරදිව දක්වන වරණය වන්නේ,

2, 66, 22, 11, 4, 15, 3

(1) 64 (2) 11 (3) 1 (4) 22 (5) 5 (......)

(28) චතුර්තක අපගමනය යනු?

(1) අන්තර් චතුර්තක පරාසය (2) පළමු චතුර්තකය

(3) අර්ධ අන්තර් චතුර්තක පරාසය (4) තෙවන චතුර්තකය

(5) මධ්‍යස්ථය (......)

(29) ''සංඛ්‍යාත බහු අශ්‍රයක වර්ගඵලය ජාල රේඛයේ වර්ගඵලයට සමාන වේ.'' මෙම කියමන,

(1) නිවැරදි ය. (2) වැරදි ය. (3) කිව නොහැකිය.

(4) අඩකට පමණක් සමාන වේ. (5) සම්බන්ධතාවක් නොමැත. (......)


(30) 10cm කින් සිතියමේ පෙන්වන මාර්ගයක් සැබෑ භූමියේ කොපමණ ගණනකින් දක්වන්නේ ද?

(1) 10km (2) 5km (3) 15km (4) 20km (5) 50km (......)

## II කොටස

- **පළමුවන ප්‍රශ්නයටත්, දෙක හෝ තුන ප්‍රශ්නවලින් එකක් තෝරාගෙන ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.**

(01) ශ්‍රී ලංකාවේ 1 : 50,000 සිතියමකින් උපුටා ගන්නා ලද කොටසක් මෙහි දැක්වේ. ඒ ඇසුරෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




1 : 50000

(01) (1) A - B සහ C - D රේඛා ඔස්සේ දක්වෙන බෑවුම් වල ස්වභාවය හැඳිනගෙන නම් කරන්න. (ල.02)

(2) අංක 1 චතුරස්‍ර ප්‍රදේශය තුළ දක්නට ලැබෙන රාජ්‍ය අංශයේ සේවාස්ථාන හතරක් නම් කරන්න. (ල.04)

(3) කුඹුක්කන් ඔය ආශ්‍රිතව හඳුනාගත හැකි ගංගා භූ ලක්ෂණ 02 ක් දක්වන්න. (ල.02)

(4) මෙම ප්‍රදේශයේ ජනාවාස විහිදී ඇත්තේ කුමන රටාවකට අනුවද? (ල.02)

(5) සමස්ත සිතියම්ගත ප්‍රදේශයේ භූ විෂමතාවය හා මානව කටයුතු පිළිබඳව රූප සටහන් සහිතව දක්වන්න. (ල.10)

(02) (1) දෛශික සිතියමක ප්‍රධාන අංග 04 ක් දක්වන්න. (ල.04)

(2) භූ ලක්ෂණ සිතියම් යනු කුමක් ද? (ල.02)

(3) අංකිත සිතියම් යනු කුමක් ද? (ල.02)

(4) දෛශික සිතියමක් අංකිත සිතියමක් බවට පත් කරන ආකාරය පැහැදිලි කරන්න. (ල.04)

(5) භූගෝල විද්‍යා තොරතුරු පද්ධතිය මගින් ලැබෙන වාසි පැහැදිලි කරන්න. (ල.08)

(03) ශ්‍රී ලංකාවේ ස්ථාන තුනක මාසික උෂ්ණත්වය 1982.

| මාස | රත්නපුර ($F^0$) | දියතලාව ($F^0$) | බදුල්ල ($F^0$) |
|---|---|---|---|
| ජනවාරි | 80 | 64 | 70 |
| පෙබරවාරි | 81 | 65 | 71 |
| මාර්තු | 82 | 67 | 73 |
| අප්‍රේල් | 82 | 69 | 75 |
| මැයි | 81 | 70 | 78 |
| ජූනි | 80 | 70 | 75 |
| ජූලි | 80 | 70 | 75 |
| අගෝස්තු | 80 | 69 | 75 |
| සැප්තැම්බර් | 80 | 69 | 75 |
| ඔක්තෝබර් | 79 | 68 | 74 |
| නොවැම්බර් | 79 | 67 | 74 |
| දෙසැම්බර් | 80 | 65 | 70 |

මූලාශ්‍රය: කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

(1) සමූහ රේඛා ප්‍රස්ථාරයක් මගින් උක්ත තොරතුරු දක්වන්න. (ල.10)

(2) රත්නපුර, දියතලාව, බදුල්ල යන නගර වල උෂ්ණත්වය පිළිබඳ ප්‍රස්තාරය ඇසුරෙන් අදහස් දක්වන්න. (ල.04)

(3) සමූහ රේඛා ප්‍රස්තාරයක ඇති වාසි මොනවා ද? (ල.02)

(4) 6, 8, 7, 4, 5 යන සංඛ්‍යාවන්හි අපගමනය සොයන්න. (ල.04)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# භූගෝල විද්‍යාව - II

13 ශ්‍රේණිය

කාලය පැය 03 යි.

- එක් එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් තෝරා ගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

## I කොටස භෞතික භූගෝල විද්‍යාව

(01) (1) පළමු ගණයේ භූ රූප, දෙවන ගණයේ භූ රූප, තෙවන ගණයේ භූ රූප, වර්ග කොට දක්වන්න. (ල.03)

(2) යමහල් භූ රූප නිර්මාණ ක්‍රියාවලියෙහි ප්‍රධාන කොටස් 02 කුමක් ද? (ල.02)

(3) විද්‍යාගාරයේ ස්වභාවය අනුව යමහල් වර්ග රූප සටහන් සහිතව පැහැදිලි කරන්න. (ල.08)

(4) යමහල් ක්‍රියාවලිය ඇති කරන ප්‍රධාන සාධක නම් කර ඒවා විස්තර කර දක්වන්න. (ල.07)

(02) (1) ජලය පවතින ස්වරූප දක්වන්න. (ල.03)

(2) පෘථිවියට ජලය ලැබෙන ක්‍රම දක්වන්න. (ල.02)

(3) ජල චක්‍රයට බලපාන සාධක පැහැදිලි කරන්න. (ල.05)

(4) ජලය දූෂණය වීමට බලපාන සාධක විස්තරාත්මකව පැහැදිලි කරන්න. (ල.05)

(5) ජල සම්පත් සංරක්ෂණයට ගත හැකි ක්‍රියාමාර්ග මොනවා ද? (ල.05)

(03) (1) දේශගුණය යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ල.04)

(2) කාලගුණික අංග නම් කර ඉන් තුනක් පිළිබඳව පැහැදිලි කරන්න. (ල.06)

(3) දේශගුණික පාලන සාධක නම් කරන්න. (ල.04)

(4) උක්ත දැක්වූ සාධක වලින් 04 ක් විස්තර කරන්න. (ල.06)

(04) (1) දේශගුණ වර්ගීකරණය ලෙස ඔබ අදහස් දක්වන්නේ කෙසේ ද? (ල.04)

(2) ප්‍රධාන දේශගුණ වර්ග නම් කර ඉන් 02 ක් පිළිබඳව පැහැදිලි කරන්න. (ල.06)

(3) නිවර්තන ආර්ද්‍ර දේශගුණයෙහි උප බෙදීම් දක්වන්න. (ල.03)

(4) ඉහත දැක්වූ බෙදීම් පැහැදිලි කරන්න. (ල.07)

## II කොටස  මානුෂ භූගෝල විද්‍යාව

(01) (1) නාගරීකරණය යනු කුමක් ද? (ල.03)

(2) නාගරීකරණය ඇති කරන සාධක විස්තර කරන්න. (ල.06)

(3) නාගරික ධූරාවලිය දක්වන්න. (ල.04)

(4) නාගරීකරණය ආශ්‍රිත විවාදිත පැහැදිලි කරන්න. (ල.07)

(02) (1) කෘෂි කර්මාන්තයේ අරමුණු දක්වන්න. (ල.04)

(2) හරිත විප්ලවය යනු කුමක් ද? (ල.06)

(3) හරිත විප්ලවයේ ප්‍රතිඵල පැහැදිලි කරන්න. (ල.05)

(4) හරිත විප්ලවයේ අවාසි පැහැදිලි කරන්න. (ල.05)

(03) (1) අස්වැන්න රටින් රටට වෙනස් වීමට බලපාන හේතු කවරේ ද? (ල.06)

(2) ඵලදායිතාව වැඩි කර ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග 04 ක් සඳහන් කරන්න. (ල.04)

(3) ආහාර සැකසීමේ වාසි පැහැදිලි කරන්න. (ල.05)

(4) ආහාර සැකසීමේ අවාසි පැහැදිලි කරන්න. (ල.05)

(04) (1) වැඩියෙන්ම බොර තෙල් නිපදවන රටවල් 03 මොනාව ද? (ල.03)

(2) ඛණිජ තෙල් වෙළඳ රටාවේ ඇති වූ ප්‍රධාන වෙනස්කම් මොනවා ද? (ල.05)

(3) ''ඛණිජ තෙල් මිළ ඉහළ යෑම සංවර්ධනය වෙමින් පවතින රට වල ආර්ථිකයට බලපෑම් කරයි.'' මෙම කියමන පැහැදිලි කරන්න. (ල.06)

(4) ඛණිජ තෙල් මිල ඉහළ යෑම නිසා මතු වූ ගැටලු අවම කරගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග මොනවා ද? (ල.06)